# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 75 දරන
# උක් පර්යේෂණ ආයතනය
# පනත

---

**[සහතිකය සටහන් කළේ 1981 දෙසැම්බර් මස 29 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1982 ජනවාරි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 65 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 75 දරන උක් පර්යේෂණ ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1981 දෙසැම්බර් මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 65/79.

**උක් පර්යේෂණ ආයතනය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1981 අංක 75 දරන උක් පර්යේෂණ ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** (1) උක් වැවීම හා වගා කිරීම සම්බන්ධයෙන් සහ එයින් යම් නිෂ්පාදනයක් සැදීම සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීමේ කාර්යය සඳහා උක් පර්යේෂණ ආයතනය යනුවෙන් හැඳින්වෙන (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයක් මේ පනතේ විධිවිධානවලට අනුකූලව පිහිටුවනු ලැබිය යුතු ය. *උක් පර්යේෂණ ආයතනය පිහිටුවීම.*

(2) ආයතනය, (1) වන උපවගන්තියෙන් දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, ඒ සංස්ථාගත නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි විය යුතු ය.

(3) පාලක මණ්ඩලයේ සාමාජිකයන් ආයතනයේ සාමාජිකයන් විය යුතු ය.

**3.** ආයතනයේ පරමාර්ථ සහ කාර්ය ක්‍රියාත්මක කිරීමෙහි ලා යුක්ති සහගත ලෙස අවශ්‍ය විය හැකි යම් බලතල, අයිතිවාසිකම් සහ කර්තව්‍ය ආයතනය සතු විය යුතු අතර, විශේෂයෙන්— *ආයතනයේ බලතල.*

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කවර වූ හෝ ආකාරයකින් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) උක් පර්යේෂණයට අදාළ ක්ෂේත්‍ර අභ්‍යාස මධ්‍යස්ථාන සහ නියමු ව්‍යාපෘති අත්කර ගැනීම, පිහිටුවීම, ස්ථාපනය කිරීම සහ මෙහෙයවීම ;

(ඇ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍ර සහ උපකරණ ආනයනය කිරීම සහ ආයතනය කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා උපකරණ, අරමුදල් සහ වෙනත් යම් ආධාර ලබා ගැනීම ;

(ඈ) ආයතනය විසින් සලසන ලද යම් සේවාවන් සඳහා ගාස්තු හෝ අයකිරීම් ලබා ගැනීම ;

(ඉ) එහි නිලධරයන් සහ සේවකයින් පත්කිරීම, සේවයෙහි නියුක්ත කරවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම ;

(ඊ) අර්ථසාධක අරමුදල් පිහිටුවා පවත්වාගෙන යාම සහ එහි සේවානියුක්තයන්ට සුබ සාධන සහ විනෝදාංශ පහසුකම් සැලැස්වීම ;

2—ඒ 66478 11,950 (81/08)

(ඪ) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ණ) ආයතනයේ කටයුතු කාර්යක්ෂම ලෙස කිරීම සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂ මණ්ඩලය සලකන යම් කර්තව්‍ය යම් සාමාජිකයකුට, ආයතනයේ අධ්‍යක්ෂට හෝ යම් සේවා නියුක්තයකුට පැවරීම ; සහ

(ත) මණ්ඩලයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට පාලක මණ්ඩලයේ මතය අනුව අවශ්‍ය වන හෝ උපයෝගී වන හෝ ආනුෂංගික වන වෙනත් සියලු දේ

කළ හැකි ය.

අමාත්‍යවරයාගේ විධාන යටතේ ආයතනය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කළ යුතු බව.

4. ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි හා ස්වකීය පරමාර්ථ ඉටුකරලීමෙහි ලා ආයතනය විසින්, කෘෂිකාර්මික සංවර්ධනයට හා පර්යේෂණයට අදාළ ආණ්ඩුවේ පොදු ප්‍රතිපත්තියට අනුකූලව සහ ඒ ප්‍රතිපත්තියට අදාළව අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ විධානයකට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

ආයතනයේ පාලක මණ්ඩලයේ සංයුතිය ආදිය.

5. (1) ආයතනයේ කටයුතු කළමනාකරණය හා පරිපාලනය කිරීම, (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලය වෙත සතු කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) ප්‍රත්‍යක්ෂ දක්ෂතාවන්ගෙන් යුත් උසස් විද්‍යාඥයන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් තිදෙනෙක් ;

(ආ) (i) ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ; සහ

(ii) මුදල් හා ක්‍රම සම්පාදනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක්

වන ("නම් කරනු ලැබූ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් දෙදෙනෙක් ; සහ

(ඇ) (i) ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ සභාපති ; සහ

(ii) ආයතනයේ අධ්‍යක්ෂ,

වශයෙන් තත් කාලයේ ධුරය දරන තැනැත්තන් විය යුතු ("නිල බලයෙන් පත් වූ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් සාමාජිකයන් දෙදෙනෙක්.

මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයන්ගේ ධුර කාලය.

6. (1) මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා කලින් ධුරය අත් හරින්නේ නම් මිස මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයකු ම අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම සුදුසු යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නේ නම්, කිසිදු හේතුවක් නොදක්වා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඔහු විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වීම, ඒ බවට අමාත්‍යවරයා වෙත අමතන ලද ලිපියක් මගින් කවර අවස්ථාවක දී වුව ද කරනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු මිය ගියහොත් හෝ ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්, 5 වන වගන්තියේ (2) (අ) උපවගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත්ව, එසේ මිය ගිය, ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට, අමාත්‍යවරයා විසින්, වෙන යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජිකයකු ස්වකීය පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කොටස තුළ ධුරය දැරිය යුතු ය.

(6) රෝගාතුරවීම නිසා හෝ අබලතාව නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ, මණ්ඩලයේ පත්කළ සාමාජිකයකුට මාස තුනකට නොඅඩු කාලයක් ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක ඒ පිළිබඳව අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් දැනුම්දීම ඒ සාමාජිකයාගේ කාර්යය විය යුතු ය. අමාත්‍යවරයා විසින්, 5 වන වගන්තියේ (2) (අ) උපවගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත්ව, ඒ සාමාජිකයා වෙනුවෙන් වැඩ බැලීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(7) ඉවත් කිරීමක් නොවන ආකාරයකින් ධුරය අත්හරින මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු, නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

7. මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ පත්කළ සාමාජිකයින් අතුරෙන් පත් කරනු ලැබිය යුතු ය. මණ්ඩලයේ සභාපති.

8. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ මණ්ඩලයේ සාමාජිකයකු පත් කිරීමේ දී යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා ම පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කෘත්‍යයක් බලරහිත නොවිය යුතු ය. යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ සාමාජිකයකු පත් කිරීමේ දී දෝෂයක් තිබීමේ හේතුවෙන් මණ්ඩලයේ ක්‍රියා හෝ කෘත්‍ය බල රහිත ලෙස නොසැලකිය යුතු බව.

9. (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් මණ්ඩලයේ සාමාජිකයින්ට ගෙවනු ලැබිය හැකි ය. සාමාජිකයින්ගේ පාරිශ්‍රමික ආදිය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් හා දීමනා ආයතනයේ අධ්‍යක්ෂ ධුරය දරන තැනැත්තාට ගෙවනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ රැස්වීම.

**10.** (1) යටත් පිරිසෙයින් එක් එක් මාසයකට වාරයක් බැගින් මණ්ඩලයේ රැස්වීමක් පැවැත්විය යුතු ය.

(2) සභාපතිවරයා හෝ ඔහු නොපැමිණි විටක දී පැමිණ සිටින සාමාජිකයින් විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයකු මණ්ඩලයේ රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියලු ප්‍රශ්න, පැමිණ සිටින සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සම වූ අවස්ථාවක මූලසුන දරන සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයින් තිදෙනකු විය යුතු අතර, මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් ස්වකීය කාර්ය පරිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ බලතල හා කාර්ය පැවරීම.

**11.** (1) මණ්ඩලය විසින්, ස්වකීය බලතල හා කාර්ය අතුරෙන් කිසිවක් සභාපතිවරයාට හෝ වෙන යම් සාමාජිකයකුට හෝ ආයතනයේ අධ්‍යක්ෂවරයාට හෝ ආයතනයේ යම් සේවා නියුක්තයකුට පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ බලතල හා කාර්ය කිසිවක් පවරා දෙනු ලැබූ සභාපතිවරයා, වෙනත් සාමාජිකයා, අධ්‍යක්ෂවරයා හෝ සේවානියුක්තයා විසින්, එසේ පවරන ලද බලතල හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව කළ යුතු ය.

ආයතනයේ අධ්‍යක්ෂ සහ ආයතනයේ වෙනත් නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

**12.** (1) ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ආයතනයේ අධ්‍යක්ෂවරයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් නිලධරයන් හා සේවකයන් මණ්ඩලය විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් මණ්ඩලයේ බලතල.

**13.** (1) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්—

(අ) ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කරනු ලැබිය හැකි ය ;

(ආ) කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කරනු ලැබිය හැකි ය ;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියම හා කොන්දේසි නිශ්චය කරනු ලැබිය හැකි ය ; තව ද

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා අර්ථසාධක අරමුදල් හා යෝජනා ක්‍රම පිහිටුවීම සහ විධිමත් කිරීම ද එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම ද කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සියලු කරුණු හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

14. (1) රජයේ සේවයේ යම් නිලධරයකු, මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්ගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, රජයේ සේවයෙහි නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ ඉල්ලීම පිට ඒ නිලධරයාගේ හා එහි ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරන ලද රජයේ සේවයේ යම් නිලධරයකුට සහ යම් නිලධරයකු සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු අතර, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරන ලද රජයේ සේවයේ යම් නිලධරයකුට හෝ යම් නිලධරයකු සම්බන්ධයෙන් ඉහත කී 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) නියමිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි යොදවනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට සේවය කරනු ලබන යම් කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු අවස්ථාවෝචිත පරිදි ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එබඳුම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ කොන්දේසි ද ඇතුළුව මණ්ඩලය හා පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ පළාත් පාලන ආයතනය එකඟවන නියම හෝ කොන්දේසි පිට, අවස්ථාවෝචිත පරිදි ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, ඒ කාර්ය මණ්ඩලයට එවැනිම කැමැත්ත ඇතිව ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තියට අනුව ආයතනයේ කාර්ය මණ්ඩලයට යම් තැනැත්තකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා, ඒ කාර්ය මණ්ඩලයේ වෙන යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

ආයතනයේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයින් ලෙස සැලකෙන බව.

15. ආයතනයේ සියලු සාමාජිකයින්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආයතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

16. අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධි විධාන එපරිද්දෙන් තේරුම් ගත යුතු ය.

ආයතනයේ අරමුදල.

17. (1) ආයතනයට, එයට ම අයත් අරමුදලක් තිබිය යුතු ය. ආයතනයේ අරමුදලට—

(අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල වෙන් කරනු ලැබිය හැකි සියලුම මුදල් ප්‍රමාණයන්;

(ආ) ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීමෙහි හා ඉටු කිරීමෙහි ලා ආයතනය විසින් ලැබිය හැකි සියලුම මුදල් ප්‍රමාණයන්; සහ

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ශ්‍රී ලංකාවෙන් පිටත කිනම් මාර්ගයකින් හෝ ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් ආයතනයට ලැබිය හැකි සියලු ම මුදල් ප්‍රමාණයන්

බැර කළ යුතු ය.

(2) ආයතනයේ බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීමෙහි හා ඉටු කිරීමෙහි ලා ආයතනය විසින් දරන ලද වියදම් ගෙවීම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු ම මුදල් ප්‍රමාණයන් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් නියම හා කොන්දේසි මත පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් ඒකාබද්ධ අරමුදලෙන් ආයතනයට ප්‍රදානය කරනු ලැබිය හැකි යම් මුදලක් ආයතනයේ ආරම්භක ප්‍රාග්ධනය විය යුතු ය.

(4) යම් විසර්ජන පනතකින් හෝ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් බලය දෙනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයකින් ආයතනයේ ප්‍රාග්ධනය කලින් කල වැඩි කරනු ලැබිය හැකි අතර ඒ මුදල් ප්‍රමාණය, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසි මත ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් ආණ්ඩුව විසින් ආයතනය වෙත ගෙවනු ලැබිය යුතු ය; නැතහොත් ලබා දිය යුතු ය.

**18.** (1) ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්, නිෂ්පාදිත සීනි වෙනුවෙන් සහ නියමයෙහි සඳහන් වෙනත් යම් උක්වල අතුරු නිෂ්පාදන වෙනුවෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් ප්‍රමාණ අනුව වූ සෙස් බද්දක් අය කිරීම, පැනවීම සහ ගෙවීම කරනු ලැබිය යුතු ය.

*සෙස් බද්ද අය කිරීම.*

(2) මේ වගන්තිය යටතේ පනවන ලද සෙස් බදු මුදල සමාන නියමයක් මගින් වෙනස් කරනු ලැබිය හැකි ය; නැතහොත් පරිච්ඡින්න කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලබන සෑම නියමයක් ම, එය ගැසට් පත්‍රයේ පළකරන ලද දිනයෙහි හෝ එහි සඳහන් යම් පසු දිනයක වලංගු විය යුතු අතර, එය පළකිරීමේ දින සිට මාස හතරක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරන ලද එවැනි යම් නියමයක් එහි අනනුමතයේ දින සිට, එසේ වුවත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගු භාවයට හානියක් නොමැතිව ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**19.** (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් හා ආකාරයකින් ආයතනය විසින් එහි ගිණුම් තැබිය යුතු ය.

*ගිණුම් සහ විගණනය.*

(2) ආයතනයේ ගිණුම් පොත් ආයතන කාර්යාලයේ තැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**20.** (1) ආයතනයේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වන්නා වූ සහ යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, එය ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ එපරිද්දෙන් අත්කර, ආයතනය වෙත පවරනු ලැබිය යුතු ය.

*ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ආයතනය සඳහා නිශ්චල දේපළ අත්කර ගැනීම.*

(2) ආයතනය වෙනුවෙන්, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් ආයතනය විසින් ගෙවනු ලැබිය යුතු ය.

**21.** (1) ආයතනයේ යම් කාර්යයක් සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වූ අවස්ථාවක, ඒ කාර්යය, රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ පිළිබඳ වූ යම් විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් දෙනු ලබන කාර්යයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එපරිද්දෙන් ඒ ආඥාපනතේ විධිවිධාන, ආයතනය වෙත දෙනු ලබන ඒ දේපළ පිළිබඳ වූ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය :

*චංචල හා නිශ්චල රජයේ දේපළක් ආයතනය වෙත ලබා දිය යුතු බව.*

එසේ වුව ද රජයේ යම් නිශ්චල දේපළකට බලපාන කිසිම නියමයක් ඒ දේපළ පිළිබඳ පාලනය ඇත්තාවූ අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් කරනු නොලැබිය යුතු ය.

(2) ආයතනයේ කාර්යය සඳහා රජයේ යම් චංචල දේපළක් අවශ්‍ය වූ අවස්ථාවක, ඒ චංචල දේපළෙහි සන්තකය හා පාවිච්චිය ආයතනයට පැවරීම හා ආයතනය වෙත සතු කිරීම, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය.

ආයතනයේ පාවිච්චිය සඳහා ස්ථාන ආදිය ආණ්ඩුව විසින් ලබා දිය යුතු බව.

22. ආයතනයේ පාවිච්චිය සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් ආණ්ඩුව විසින් සපයනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත ගනු ලබන ක්‍රියා මාර්ග සඳහා ආරක්ෂාව.

23. (1) (අ) මේ පනත යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ දී ඔහුට විරුද්ධව ගෙනෙන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක් දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් යයි අධිකරණය පිළිගන්නාහොත්, ආයතනයේ අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

පුද්ගලයකු වශයෙන් මණ්ඩලයේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

24. ආයතනයට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් නඩුවක දී පුද්ගලයකු වශයෙන් මණ්ඩලයේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව කිසිම රිට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

රීති සෑදීමට ආයතනය සතු බලය.

25. (1) රීති සෑදිය යුතු යයි මේ පනතින් බලය දී ඇති හෝ නියමිත කරුණු සියල්ලම හෝ යම් කරුණක් සම්බන්ධයෙන් ආයතනය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) ආයතනය විසින් සාදන ලද කිසිම රීතියක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තුරු, බලාත්මක නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.